- **ආදරණීය දුවේ පුතේ,**
- **මෙම ඡේදය හොඳින් කියවන්න.**

සිරිමත්

සිරිමත් උදෑසනින් ම අවදි විය. කුරුල්ලන්ගේ මිහිරි නාදය මිහිරි ගීතයක් සේ ඔහුට හැඟුණි. ඔහු විගස මුහුණ සෝදා කියවීම් පොත රැගෙන කියවන්නට පටන් ගත්තේ ය. පූසාත් බල්ලාත් පොත් මේසය යට ගුළි ගැසී නිදා සිටිති. "අපේ පුතා කොච්චර හොඳ ද ? උදෙන් ම නැඟිටලා පාඩම් වැඩ" අම්මා තාත්තාට කියනු මට ඇසිණි. "ඔය කේතලය පොඩ්ඩකට මෙහාට දෙන්න. මම වතුර එකක් ළිපේ තියන්නම්" යැයි තාත්තා කිවුවේ ය. කියවීම් පොත කියවීමෙන් අනතුරු ව චිත්‍ර පොතත්, පාට පෙට්ටියත්, පැන්සලත් ගෙන "හිමිදිරියේ අසිරිය" පිළිබඳ ව චිත්‍රයක් ඇන්දෙමි. ඒ වන විට ඔරලෝසුවේ වේලාව 7.00 සටහන් වී තිබුණි. "පුතා, මම අද මහරගම සීයලාගේ ගෙදර ගිහින් එන්න යනවා. මගෙ පුතා හොඳ ළමයා වගේ පාඩම් වැඩ ඉවර කරලා, සෙල්ලම් කරලා පරිස්සමට ඉන්න ඕනෑ" යැයි තාත්තා කිවුවේ ය. කොට්ටාවේ ඇති අපේ නිවසේ සිට පන්නිපිටිය පසු කළ විට මහරගම නගරය හමු වේ. "හොඳයි තාත්තා. තාත්තාත් පරිස්සමට ගිහිං එන්න" යැයි සිරිමත් පැවසුවේ ය.

ඡේදය ආශ්‍රිතව පහත වගුව පුරවන්න.

ද්‍රව්‍ය නාම	සත්ව නාම	පුද්ගල නාම	ස්ථාන නාම

- **ඔබේ සිංහල කියවීම් පොත ගන්න**

එහි කැමැති පාඩම් මාතෘකාවක් මෙහි ලියන්න:-.....

එය හොඳින් ශබ්ද නගා කියවා පහත වගුව පුරවන්න.

ඡේදය ආශ්‍රිතව පහත වගුව පුරවන්න.

ද්‍රව්‍ය නාම	සත්ව නාම	පුද්ගල නාම	ස්ථාන නාම